අහෝ අල්ලාහ්! කවරෙකු මාගේ සමූහයේ යම් කටයුත්තක් භාරගෙන ඔවුන් වෙත දුෂ්කරතා ඇති කරන්නේ ද ඔබ ද ඔහුට එරෙහිව දුෂ්කරතා ඇති කරනු මැනව. තවද කවරෙකු මාගේ සමූහයේ කටයුත්තක් භාරගෙන ඔවුන් සම්බන්ධයෙන් මෘදු ලෙස කටයුතු කරන්නේ ද ඔහු සම්බන්ධයෙන් ද ඔබ මෘදු ලෙස කටයුතු කරනු මැනව.

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා මේ මාගේ නිවසේ හිද කළ ප්රකාශයකට මම සවන් දුනිමි යැයි පවසා ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය මෙසේ වාර්තා
කළාය. “අහෝ අල්ලාහ්! කවරෙකු මාගේ සමූහයේ යම් කටයුත්තක් භාරගෙන ඔවුන් වෙත
දුෂ්කරතා ඇති කරන්නේ ද ඔබ ද ඔහුට එරෙහිව දුෂ්කරතා ඇති කරනු මැනව. තවද කවරෙකු මාගේ සමූහයේ කටයුත්තක් භාරගෙන ඔවුන් සම්බන්ධයෙන් මෘදු ලෙස කටයුතු කරන්නේ ද ඔහු සම්බන්ධයෙන් ද ඔබ මෘදු ලෙස කටයුතු කරනු මැනව.” [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

මෙම හදීසයේ භාරකාරත්වයේ බරපතලකම පිළිබඳ පැහැදිලි කර ඇත. කවරෙකු හෝ ජනයා අතර යම් කටයුත්තක් භාර ගෙන පසුව ඔවුනට පීඩා ඇතිවන පරිදි කටයුතු කරන්නේ ද ඒ හා සමානව ඔහු සමග අල්ලාහ් ද කටයුතු කරන මෙන් ද ඔහු ඔවුන් සමග යුක්ති ගරුකව, සාධාරණව, කරුණාවෙන් හා මෛත්රියෙන් කටයුතු කරන්නේ ද ඒ හා සමානව ඔහු සමග අල්ලාහ් කටයුතු කරන මෙන් ද නබි (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) තුමා අල්ලාහ්ගෙන් ප්රාර්ථනා කළහ. ප්රතිඵල ක්රියාවේ වර්ගයෙන්ම පිහිටනු ඇත.

https://sunnah.global/hadeeth/si/show/4938